# පොළොන්නරුවේ තිවංක පිළිමගේ කලාත්මක ගෘහ නිර්මාණ ශෛලිය

අංජලී වික්‍රමසිංහ
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය

## ABSTRACT

කලාත්මක ගෘහ නිර්මාණ හැකියාව පිළිබඳ ශ්‍රී ලාංකිකයට ඇත්තේ ප්‍රකට ඉතිහාසයකි. සාහිත්‍යයික හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය අධ්‍යයනයෙන් එහි සත්‍යාසත්‍යතාව වටහා ගත හැකිය. පොළොන්නරු යුගයට පූර්වයේ පැවති කලා නිර්මාණ මුහුණුවරට වඩා පොළොන්නරු යුගයේ කලා නිර්මාණ වෙනස් විය. නිර්මාණ ස්වරූපය වෙනස් වුව ද, මේ යුගයේ ආගමික අනුග්‍රාහකයෙන්ගේ සහ ශිල්පින්ගේ පරමාර්ථය වූයේ ද පුදපූජා පැවැත්වීම, ආගමික ශ්‍රද්ධා භක්තිය වර්ධනය කිරීම හා ආගමික ප්‍රභූත්වයට අදාළ වන පූජනීය ස්ථාන හා එකී පරමාර්ථයනට සාපේක්ෂ නිර්මාණ බිහි කිරීමයි. එහි දී මහායාන, තන්ත්‍රයාන ආදී බෞද්ධාගමික බලපෑම් ද, උත්තර හා දක්ෂිණ භාරතිය කලා සම්ප්‍රදායන්හි ආභාසය ද හේතුවෙන් අනුරාධපුර යුගයේ ගෘහ නිර්මාණවලට වඩා විචිත්‍රත්වයක් හා සංකීර්ණත්වයක් පොළොන්නරු යුගයට අයත් නිර්මාණවලට ආරෝපණය විය. අනුරාධපුර යුගයේ නිර්මාණ ශිල්ප ක්‍රමයෙහි ප්‍රධාන ලක්ෂණය නම් සරල භාවයත්, ප්‍රමාණ සමතාව හා අලංකාරය දනවීම සඳහා විසිතුරු කැටයම්වලට වඩා තාත්වික ස්වරූපය උපයෝගි කරගැනීමත් වේ. පොළොන්නරු යුගයේ ගෘහ නිර්මාණ ශිල්පය අනුරාධපුර යුගයේ එම ශිල්පයට වඩා ඇතැම් කාරණා අතින් වෙනස් වේ. පොළොන්නරු යුගයේ තනවන ලද ගොඩනැගිලිවල රූප ලක්ෂණ වින්‍යාස කොට බලන කල ඒවායේ ගෘහ නිර්මාණ සම්ප්‍රදාය අනුරාධපුර යුගයේ ක්‍රමයට නොවෙනස් එහි ක්‍රමික වර්ධනයක් බව පැහැදිලි වේ. එම වෙනස හඳුනාගැනීමට හැකි ප්‍රධාන ලක්ෂණයක් වන්නේ එය පිටතින් ද ඇතුළතින් ද අලංකාර කර තිබීමයි.

කලාත්මක සෞන්දර්ය මතු කිරීමෙහි ලා පොළොන්නරු යුගයේ ගොඩනැගිලිවල බාහිර ස්වරූපය හැඩගැන්වුණු ආකාරය තිවංක පිළිමගෙය, ලංකාතිලක පිළිමගෙය බඳු නිර්මාණවලින් අවබෝධ කරගත හැකි වේ. වන්දනාමාන සඳහා එන අයගේ සිත් ශ්‍රද්ධාවෙන් යුතු ව ප්‍රසාද සංවේගය ඇති කිරීම ඒවායේ පරමාර්ථය වූ බව නිසැක ය. පොළොන්නරුවේ තිවංක පිළිමගෙය ඇතුළත මෙන් ම පිටත බිත්ති චිත්‍ර හා මූර්තිවලින් හැඩ ගන්වා ඇති කලාත්මක නිර්මාණයකි. එම සමස්ත නිර්මාණය ම එක් ප්‍රබල අරමුණක පිහිටා නිර්මාණය කරන ලද විශිෂ්ට ගණයේ නිර්මාණ කාර්යයක් බව පැහැදිලි ය. කාමී බවෙන් නිශ්කාමී බවට පිවිස සත්‍යාවබෝධයෙන් නිවන් මග අවබෝධ කර ගැනීම යන සංකල්පය මූලික කරගෙන මෙය නිර්මාණය කර තිබේ.